# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2484/03 - 2026 අප්‍රේල් මස 16 වැනි බ්‍රහස්පතින්දා - 2026.04.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සමිති ආඥාපනත

සමිති ආඥාපනතේ (123 අධිකාරය) 3 වන හා 4 වන වගන්තිවලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍ය වසන්ත සමරසිංහ වන මම මේ නිවේදනයෙන්;

(1) පහත සඳහන් පරමාර්ථයන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් **අංක 45/7, විශ්ව විද්‍යාල වතුරශ්‍රය, දංගොල්ල, මහනුවර** දරන ස්ථානයේ පිහිටි **"සයිකොලොජි ඇසෝසියේෂන් ඔෆ් ශ්‍රී ලංකා"** නමැති සමිතිය 1891 අංක 16 දරන සමිති ආඥාපනතේ 3(ආ) වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා බලය පවරමි.

(a) විෂයයක් ලෙස වෘත්තියක් ලෙසත් මනෝවිද්‍යාව ක්ෂේත්‍රය ශ්‍රී ලංකාව තුළ පුළුල් කිරීම.

(b) මනෝවිද්‍යාව සහ එහි යෙදුම් සම්බන්ධ දැනුම ප්‍රවර්ධනය හා ප්‍රචාරණය කිරීම.

(c) මනෝවිද්‍යාව සම්බන්ධ වෘත්තීය දැනුම වර්ධනය කිරීමේ අරමුණින් පර්යේෂණ දිරිමත් කිරීම.

(d) ශ්‍රී ලංකාවේ මනෝවිද්‍යා ක්‍රියාවලියේදී භාවිතා කරන උපකරණ සහ යන්ත්‍ර සංවර්ධනය, සම්මතකරණය, භාවිතය සහ ඇගයීම සම්බන්ධයෙන් නිසි ප්‍රමිතීන් පවත්වාගෙන යාම සහ සාමාජිකයින්ගේ වෘත්තීය කටයුතු නියාමනය කිරීම.

(e) මනෝවිද්‍යා පරීක්ෂණ භාවිතය සහ එම පරීක්ෂණවල ප්‍රතිඵල අර්ථකථනය කිරීම සඳහා අවශ්‍ය විශේෂඥ දැනුම සම්බන්ධයෙන් සෞඛ්‍ය නියාමන ආයතන, සංවිධාන, සෞඛ්‍ය සේවා භාවිතා කරන්නන් සහ සාමාන්‍ය ජනතාවට උපදෙස් දීම හා මනෝවිද්‍යා පරීක්ෂණ භාවිතය සඳහා සුදුසුකම් ප්‍රමිතීන් වෙනුවෙන් ප්‍රචාරක කටයුතු කිරීම.

(f) සාමාජිකයින්ගේ වෘත්තීය රුචිඥතා ආරක්ෂා කිරීම සහ දැනුම හා වෘත්තීය විශේෂඥතාවය පුළුල් කිරීම සඳහා සහාය ලබා දීම.

(g) මනෝවිද්‍යාව සම්බන්ධ පර්යේෂණ සහ ප්‍රකාශන කටයුතු සඳහා සහාය ලබා දීම සහ අදාළ අධ්‍යයන ද්‍රව්‍ය වෙත ප්‍රවේශය පහසු කිරීම.

(h) මනෝවිද්‍යා ක්ෂේත්‍රයේ සම්බන්ධ පුද්ගලයින් අතර නීතිවිරෝධී හෝ අනිසි වෘත්තීය ක්‍රියාකාරකම් වළක්වා, සදාචාරාත්මක වෘත්තීමය නියැලීම ප්‍රවර්ධනය කිරීම සඳහා සදාචාරාත්මක ආචාරධර්ම සංග්‍රහයක් ස්ථාපනය කිරීම.


1A - G 46603 — 04 (2026/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(i) මනෝවිද්‍යාවේ විශේෂිත ක්ෂේත්‍රයන්හි වෘත්තීමය නියැලීම සඳහා අවම සුදුසුකම් සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම.

(j) මනෝවිද්‍යාවේ විවිධ ක්ෂේත්‍රයන්හි සමුළු, වැඩමුළු සහ දේශන සංවිධානය කිරීම සහ ජාලගත වීමේ/ සම්බන්ධතා ගොඩනැංවීමේ අවස්ථා සැපයීම.

(k) සමාජයේ අරමුණු සමග සමාන අරමුණු ඇති අනෙකුත් ශ්‍රී ලාංකීය හෝ විදේශීය සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

(l) මනෝවිද්‍යාව සහ ඒ ආශ්‍රිත විෂයයන් සම්බන්ධ පර්යේෂණ, අධ්‍යයන, ලිපි සහ අනෙකුත් රචනා ඇතුළත් සඟරාවක් ප්‍රකාශයට පත්කිරීම.

ඉහත 4(1) වගන්තියෙහි සඳහන් අරමුණු, ජාතිය, ආගම, භාෂාව, වර්ගය, ලිංගභේදය, දේශපාලන අදහස්, උපන් ස්ථානය හෝ වෙනත් කිසිදු පදනමක් මත වෙනස්කම් නොකර ක්‍රියාත්මක කරනු ලබන බව සමාජය සහතික කරනු ඇත.

(2) ඉහත කී සමිතිය, සමිති ආඥාපනතේ 5(4) වගන්තියේ විධිවිධානවලින් නිදහස් කරමි.

**වසන්ත සමරසිංහ,**
වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා
සමුපකාර සංවර්ධන අමාත්‍ය.

2026 ක් වූ මාර්තු මස 19 වැනි දින,
වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය,
අංක. 492,
එල්. එච්. පී. ගොඩනැගිල්ල,
ආර්. ඒ. ද මෙල් මාවත,
කොළඹ 03.

EOG 04 - 0062/1

---

**සමිති ආඥාපනත**

සමිති ආඥාපනතේ (123 අධිකාරය) 3 වන හා 4 වන වගන්තිවලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍ය වසන්ත සමරසිංහ වන මම මේ නිවේදනයෙන්;

(1) පහත සඳහන් පරමාර්ථයන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් **අංක. 280/2, පරණ නුවර පාර, දළුගම, කැලණිය.** දරන ස්ථානයේ පිහිටි **"ප්‍රයිම් විලාස් දළුගම මැනේජ්මන්ට් සොසයිටි"** නමැති සමිතිය 1891 අංක 16 දරන සමිති ආඥාපනතේ 3(ආ) වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා බලය පවරමි.

I. ප්‍රයිම් විලාස් දළුගම සංකීර්ණයේ (මෙතැන් සිට "පහසුකම" ලෙස හැඳින්වෙන) නඩත්තු කිරීම, පවත්වාගෙන යාම සහ සමස්ථ යහපැවැත්ම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබීම.

II. පහසුකමේ හිමිකරුවන්/නේවාසිකයන්ගේ පොදු අභිලාෂයන්, සුභසාධනය, අයිතිවාසිකම් සහ වරප්‍රසාද ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම.

III. පහසුකමේ පොදු අභිලාෂයට සම්බන්ධ කිසියම් ගැටළුවක් ඇති වූ විට හෝ ඉදිරියේදී උද්ගතවන සෑම අවස්ථාවකදීම, එම ගැටළු නිරාකරණය කිරීම සඳහා අදාළ බලධාරීන් සමඟ අවශ්‍ය සියලුම ක්‍රියාමාර්ග ගනු ලැබීම.

IV. පහසුකමේ සියලුම හිමිකරුවන්/නේවාසිකයන් අතර හොඳ හිත, එකිනෙකා පිළිබඳ අවබෝධය, සාමය සහ සමගිය ප්‍රවර්ධනය කිරීම සහ දිරිමත් කිරීම.

V. සමාජයේ වගකීම් සහ බැඳීම් ඉටු කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සහතික කිරීම.

VI. අවශ්‍ය පරිදි නේවාසිකයන් සඳහා සංස්කෘතික සහ සමාජීය උත්සව සංවිධානය කිරීම.

(2) ඉහත කී සමිතිය, සමිති ආඥාපනතේ 5(4) වගන්තියේ විධිවිධානවලින් නිදහස් කරමි.

**වසන්ත සමරසිංහ,**
වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා
සමුපකාර සංවර්ධන අමාත්‍ය.

2026 ක් වූ මාර්තු මස 19 වැනි දින,
වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය,
නො. 492,
එල්. එච්. පී. ගොඩනැගිල්ල,
ආර්. එල්. ද මෙල් මාවත,
කොළඹ 03.

EOG 04 - 0062/2

---

## සමිති ආඥාපනත

සමිති ආඥාපනතේ (123 අධිකාරය) 3 වන හා 4 වන වගන්තිවලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍ය වසන්ත සමරසිංහ වන මම මේ නිවේදනයෙන්;

(1) **පහත සඳහන් පරමාර්ථයන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන්** හෝමාගම, මාලපල්ල, වැකඩ පාර, අංක 38/01/09 දරන ස්ථානයේ පිහිටි **"සිලෝන් ටුවරිස්ට් ඩ්‍රයිවර්ස්' ඇසෝසියේෂන්"** නමැති සමිතිය 1891 අංක 16 දරන සමිති ආඥාපනතේ 3(ආ) වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා බලය පවරමි.

I. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ දියුණුව උදෙසා දායක වීම.

II. ජාතික රියදුරු ප්‍රමිති වර්ධනයට නායකත්වය ලබා දීම.

III. රියදුරන්ගේ ඉහලම තත්ව ප්‍රමිතීන් වර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම හා රියදුරු ක්ෂේත්‍රයේ ක්‍රියාකාරී සාමාජිකයන්ගේ අදහස් වෙනුවෙන් පෙනී සිටීම හා නියෝජනය කිරීම.

IV. පොදු අවශ්‍යතා වෙනුවෙන් පෙනීසිටින සංවිධාන හා රජය සමග සම්බන්ධ වී පොදු අරමුණු ඉටුකරගැනීමට පෙනී සිටීම.

V. සාමාජිකයන්ගේ පොදු අයිතිවාසිකම් ආරක්ෂා කිරීම උදෙසා නියෝජිතයෙකු ලෙස පෙනී සිටීම.

VI. රියදුරු ප්‍රජාවගේ සමාජ අවශ්‍යතා සඳහා සහය දැක්වීම, ප්‍රවර්ධන හා ඒ සඳහා සාමාජිකයන්ගේ සහභාගීත්වය දිරිමත් කිරීම.

VII. සාමාජිකයන්ගේ සුභසාධන කටයුතු ප්‍රවර්ධනය කිරීම.

(2) ඉහත කී සමිතිය, සමිති ආඥාපනතේ 5(4) වගන්තියේ විධිවිධානවලින් නිදහස් කරමි.

**වසන්ත සමරසිංහ,**
වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා
සමුපකාර සංවර්ධන අමාත්‍ය.

2026 ක් වූ මාර්තු මස 26 වැනි දින,
වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය,
අංක 492,
එල්. එච්. පී. ගොඩනැගිල්ල,
ආර්. ඒ. ද මෙල් මාවත,
කොළඹ 03.

EOG 04 - 0062/3

**සමිති ආඥාපනත**

සමිති ආඥාපනතේ (123 අධිකාරය) 3 වන හා 4 වන වගන්තිවලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍ය වසන්ත සමරසිංහ වන මම මේ නිවේදනයෙන්;

(1) **පහත සඳහන් පරමාර්ථයන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් දන්කොටුවව, ලිහිරියාගම, බුජ්ජම්පොල** දරන ස්ථානයේ පිහිටි **"හරිත ලංකා කාබනික ගොවි සංගමය"** නමැති සමිතිය 1891 අංක 16 දරන සමිති ආඥාපනතේ 3 (ආ) වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා බලය පවරමි.

i. නව්‍ය කෘෂි තාක්ෂණික දැනුම, පුහුණුව, උපකරණ සහ ආධාර උපකාර තුළින් පරිසර හිතකාමී අයුරින් භෝග වගාව සහ නිෂ්පාදන සැකසීම සඳහා සාමාජික වගාකරුවන් දිරිගැන්වීම සහ ස්ථාවර වෙළෙඳපොළක් සැකසීම හරහා සාමාජික ගොවි මහත්ම මහත්මීන්ගේ ආර්ථික සාමාජීය මට්ටම් උසස් තත්වයකට ගෙන ඒම.

(2) ඉහත කී සමිතිය, සමිති ආඥාපනතේ 5 (4) වගන්තියේ විධිවිධාන වලින් නිදහස් කරමි.

**වසන්ත සමරසිංහ,**
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා
සමුපකාර සංවර්ධන අමාත්‍ය.

2026 ක් වූ මාර්තු මස 19 වැනි දින,
වෙළෙඳ, වාණිජ, ආහාර සුක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය,
අංක 492,
එල් එච් පී ගොඩනැගිල්ල,
ආර්. ඒ. ද මෙල් මාවත,
කොළඹ 03.

EOG 04 - 0062/4

---

**සමිති ආඥාපනත**

සමිති ආඥාපනතේ (123 අධිකාරය) 3 වන හා 4 වන වගන්තිවලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍ය වසන්ත සමරසිංහ වන මම මේ නිවේදනයෙන්;

(1) **පහත සඳහන් පරමාර්ථයන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් කොන්වැව, නියදවනය, මිල්ලගල ආරාමය** දරන ස්ථානයේ පිහිටි **"ජාතික මෙහෙණි සභාව"** නමැති සමිතිය 1891 අංක 16 දරන සමිති ආඥාපනතේ 3 (ආ) වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා බලය පවරමි.

i. සමිති ව්‍යවස්ථාව පිළිගෙන සාමාජිකත්වයට ඇතුළත් වන්නා වූ සියළුම මෙහෙණින් වහන්සේලාගේ අභිවෘද්ධිය සලසාදීම.

ii. එසේ සාමාජිකත්වය ලබාගත් සෑමදෙනාම විසින්ම සම්බුද්ධ ශාසනය ආරක්ෂා කර ගනිමින් ඉදිරි පැවැත්ම උදෙසා අවංකව හා ගෞරවාන්විතව ක්‍රියා කිරීම.

iii. දෙස් විදෙස් සබඳතා පුළුල්ව ගොඩනගා ශක්තිමත් මෙහෙණි බල මුළුවක් තුළින් ගිහි පැවිදි ලොකු කුඩා සැම දෙනාගේම යහපත උදෙසා හැකි සැම අයුරකින්ම අනුශාසනා කිරීම, මග පෙන්වීම හා ආධාර උපකාර කිරීම.

(2) ඉහත කී සමිතිය, සමිති ආඥාපනතේ 5 (4) වගන්තියේ විධිවිධානවලින් නිදහස් කරමි.

**වසන්ත සමරසිංහ,**
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා
සමුපකාර සංවර්ධන අමාත්‍ය.

2026 ක් වූ මාර්තු මස 26 වැනි දින,
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය,
අංක 492,
එල් එච් පී ගොඩනැගිල්ල,
ආර්. ඒ. ද මෙල් මාවත,
කොළඹ 03.

EOG 04 - 0062/5

---

**සමිති ආඥාපනත**

සමිති ආඥාපනතේ (123 අධිකාරය) 3 වන හා 4 වන වගන්තිවලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍ය වසන්ත සමරසිංහ වන මම මේ නිවේදනයෙන්;

(1) **පහත සඳහන් පරමාර්ථයන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් දෙණියාය, පල්ලෙගම, කොළවෙනිගම, ලුම්බිණි ටී ෆැක්ටරි දරන ස්ථානයේ පිහිටි** "ලුම්බිණි ඕගර්නික් ටී ෆාර්මර්ස් ඇසෝසියේෂන්" නමැති සමිතිය 1891 අංක 16 දරන සමිති ආඥාපනතේ 3(ආ) වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා බලය පවරමි.

i. නවතම යුරෝපා සංගම් කාබනික නියාමනය 2018/848 සමඟ පූර්ණ අනුකූලතාවයක් සහතික කිරීම;

ii. සොයා ගැනීමේ හැකියාව, වාර්තා තබා ගැනීම, යෙදවුම් භාවිතය සහ කණ්ඩායම් සහතික කිරීම ඇතුළු නව නියාමනයේ ප්‍රධාන අංශ පිළිබඳව ගොවීන් පුහුණු කිරීම;

iii. යුරෝපා සංගමයේ පාරිසරික අවධානයට අනුකූලව ජෛව විවිධත්වය වැඩිදියුණු කිරීම, පාංශු සෞඛ්‍ය නිරීක්ෂණය සහ සංවෘත පෝෂක චක්‍ර වැනි අනුකූලතාවයෙන් ඔබ්බට යන පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම.

(2) ඉහත කී සමිතිය, සමිති ආඥාපනතේ 5(4) වගන්තියේ විධිවිධාන වලින් නිදහස් කරමි.

**වසන්ත සමරසිංහ,**
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා
සමුපකාර, සංවර්ධන අමාත්‍ය.

2026 ක් වූ මාර්තු මස 23 වැනි දින,
වෙළෙඳ, වාණිජ, ආහාර සුක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය,
අංක 492, දෙවන මහල,
එල් එච් පී ගොඩනැගිල්ල,
ආර්. ඒ. ද මෙල් මාවත,
කොළඹ 03.

EOG 04 - 0062/6

**සමිති ආඥාපනත**

සමිති ආඥාපනතේ (123 අධිකාරය) 3 වන හා 4 වන වගන්තිවලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍ය වසන්ත සමරසිංහ වන මම මේ නිවේදනයෙන්;

(1) **පහත සඳහන් පරමාර්ථයන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා, පිළියන්දල, කොලමුන්න,** නො. 11 දරන ස්ථානයේ පිහිටි **"ශ්‍රී ලංකන් මැතමැටිකල් සොසයිටි"** නමැති සමිතිය 1891 අංක 16 දරන සමිති ආඥාපනතේ 3 (ආ) වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා බලය පවරමි.

i. සියලු මට්ටම්වල ගණිත අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සහ දියුණු කිරීම;

ii. ගණිතමය පර්යේෂණ සහ නවෝත්පාදන දිරිමත් කිරීම සහ සහාය දීම;

iii. ගණිත ක්ෂේත්‍රයේ අධ්‍යාපනඥයින්, පර්යේෂකයින් සහ සිසුන් අතර සහයෝගීතාව වර්ධනය කිරීම;

iv. ගණිතමය දැනුම සහ එහි යෙදීම් වර්ධනයට දායක වන සම්මන්ත්‍රණ, වැඩමුළු සහ ප්‍රකාශන සංවිධානය කිරීම.

(2) ඉහත කී සමිතිය, සමිති ආඥාපනතේ 5(4) වගන්තියේ විධිවිධානවලින් නිදහස් කරමි.

**වසන්ත සමරසිංහ,**
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා
සමුපකාර සංවර්ධන අමාත්‍ය.

2026 ක් වූ මාර්තු මස 23 වැනි දින,
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය,
අංක 492,
එල් එච් පී ගොඩනැගිල්ල,
ආර්. ඒ. ද මෙල් මාවත,
කොළඹ 03.

EOG 04 - 0062/7

---

**සමිති ආඥාපනත**

සමිති ආඥාපනතේ (123 අධිකාරය) 3 වන හා 4 වන වගන්තිවලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍ය වසන්ත සමරසිංහ වන මම මේ නිවේදනයෙන්;

(1) **පහත සඳහන් පරමාර්ථයන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් කළුතර දකුණ, රතු කුරුස නිවාස,** නො. 01 දරන ස්ථානයේ පිහිටි **"ඕල් අයිලන්ඩ් ට්‍රේන් ඇන්ඩ් බස් මොබයිල් ට්‍රේඩර්ස් ඇන්ඩ් ඇසෝසියේෂන්"** නැමැති සමිතිය 1891 අංක 16 දරන සමිති ආඥාපනතේ 3 (ආ) වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා බලය පවරමි.

i. දුම්රිය මගීන් හට යහපත් සේවාවක් ලබා දීම;

ii. දුම්රිය මගීන් හට පීඩාකාරී ලෙස හා වංචනික ලෙස හැසිරෙන්නන් නීතියේ රැහැනට හසුකර දීම සඳහා ඉදිරිපත් වීම;

iii. සාමාජික සාමාජිකාවන්ගේ හා ඔවුන්ගේ පවුල්වල ආර්ථික, සාමාජයීය, සංස්කෘතික අවශ්‍යතා වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වැඩසටහන් සංවිධානය කිරීම;

iv. දිවයින පුරා සිටින ජංගම වෙළඳුන් ඒකරාශී කිරීම, සංවිධානය කිරීම, සවිබල ගැන්වීම;

v. සාමාජික සාමාජිකාවන්ගේ කුඩා ව්‍යාපාර කටයුතු පියවරෙන් පියවර සංවිධිත ව්‍යාපාර බවට පත් කිරීම සඳහා පුහුණුව, තාක්ෂණික දැනුම, විද්‍යාත්මක දැනුම හා නීති ආධාර ලබා දීම සඳහා රාජ්‍ය හා පුද්ගලික ආයතන සම්බන්ධීකරණය කිරීම;

vi. සාමාජික සාමාජිකාවන්ගේ මරණයකදී, හදිසි අවශ්‍යතාවයකදී විශ්‍රාම යාමකදී යම් මුදලක් ලබා දීමට අවශ්‍ය ක්‍රමවේද, සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

(2) ඉහත කී සමිතිය, සමිති ආඥාපනතේ 5(4) වගන්තියේ විධිවිධානවලින් නිදහස් කරමි.

**වසන්ත සමරසිංහ,**
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා
සමුපකාර සංවර්ධන අමාත්‍ය.

2026 ක් වූ මාර්තු මස 23 වැනි දින,
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය,
අංක 492, දෙවන මහල,
එල් එච් පී ගොඩනැගිල්ල,
ආර්. ඒ. ද මෙල් මාවත,
කොළඹ 03.

EOG 04 - 0062/8

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.